රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 26/2013


මගේ අංකය: EST-7/WARNT/07/1010

රාජ්‍ය පරිපාලන හා

ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

නිදහස් චතුරශ්‍රය

කොළඹ 07


2013.11.21

අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් ප්‍රධාන ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>ආයතන සංග්‍රහයේ XVI පරිච්ඡේදයේ 2:5, 2:6 හා 2:7 උප වගන්ති සංශෝධනය කිරීම.</u>**

ආයතන සංග්‍රහයේ XVI පරිච්ඡේදයේ 02 වගන්තිය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එම වගන්තියේ 2:5, 2:6 හා 2:7 උප වගන්ති පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට 2013.10.03 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

2:5. සෑම බලපත්‍රයකම ගමන් කරන දිනය නිශ්චිත වශයෙන් සඳහන් කළ යුතුය; නිකුත් කළ දිනය හා ගමන් කරන දිනය අතර කාලය, 2:7 උප වගන්තියේ දැක්වෙන ව්‍යතිරේකයට යටත්ව දවස් 30කට වැඩි නොවිය යුතුය.

2:6. එතෙකුදු වුවත්, බලපත්‍රයේ දැක්වෙන “ගමන් කරන දිනය” ට කලින් දවස් 14 ඇතුළත දී හෝ එම දිනට පසුව එන දවස් 14 ඇතුළත දී හෝ බලපත්‍රයක් පාවිච්චි කළ හැකිය.

2.7 ඉඩ පහසුකම් කලින් වෙන් කරවා ගත හැකි විට (එනම් නිදන මැදිරියක, නිරීක්ෂණ මැදිරියක, වායු සමනය කළ දුම්රිය මැදිරියක යනාදියේ) බලපත්‍රයක් නිකුත් කරනු ලබන තැනැත්තාට යන ගමන සඳහා ඉඩ පහසුකම් වෙන් කරවා ගන්නා අවස්ථාවේ දී ආපසු එන ගමන සඳහා ද එසේ ඉඩ පහසුකම් වෙන් කරවා ගැනීමට හැකිවනු පිණිස, ආපසු එන ගමන සඳහා නිකුත් කරනු ලබන බලපත්‍රයේ, එම බලපත්‍රය නිකුත් කරන දිනයේ සිට දවස් 45 නොඉක්මවන දිනයක් ගමන් කරන දිනය ලෙස සඳහන් කළ හැකිය.

පී.බී. අබේකෝන්

ලේකම්

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය